**කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2023**

**----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ("විද්‍යායතනය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්කභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල විද්‍යායතනය විසින් සමාලෝචිත වර්ෂය තුළදී වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන රු.101,891ක් මූල්‍ය ප්‍රකාශන තුළ හුවමාරු නොවන ගනුදෙනුවලින් ලද ආදායම ලෙස හඳුනා ගැනීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියට උපදෙස් පරිදි කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 19 වගන්තියේ දැක්වෙන පරිදි විශ්වවිද්‍යාල විද්‍යායතනය තුළ ඉදිකර ඇති මළ ප්‍රවාහන පද්ධති, ජල නල හා සන්නිවේදන පද්ධති අගය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල විද්‍යායතනය තුල ඉදිකර ඇති පද්ධති වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 ඡේදයට පටහැනිව ක්ෂය කිරීමේ දී වත්කම් මිලදී ගත් දිනය නොසලකා සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගත් වත්කම් සඳහා සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය රු.1,328,901ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා දේපල පිරියත හා උපකරණ එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි යටතේ ගිණුම් ගත කර තිබුණු වටිනාකම රු.2,230,539ක් වූ මාර්ග පද්ධති සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ගිණුමෙන් ඉවත් කර යටිතල පහසුකම් පිරිවැය (Infrastructure Cost) ලෙස වත්කම් ගිණුමකට ගිණුම් ගත කර තිබුණද එම වත්කම් ක්ෂය කිරීමේ පදනම හඳුනාගෙන ක්ෂය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මාර්ග පද්ධති ගිණුමට අදාලව ඉදිරියේදි ක්ෂය ගණනය කිරීමට කටයුතු කරන බව. | වත්කම් ක්ෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | විද්‍යායතනයේ කථිකාචාර්යවරියකුගේ තනතුර උසස් කිරීම හේතුවෙන් හිඟ වැටුප් ගෙවීමේදී සිදු වී තිබුණු දෝෂ නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදලට ගැලපිය යුතු රු.266,132ක් වර්ෂයේ වියදමෙන් අඩු කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී සමුච්චිත අරමුදලට ගැලපීම මඟින් එවැනි වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2020 වර්ෂයේ සේවය අතහැර ගිය කථිකාචාර්යවරියකගෙන් අයවිය යුතු රු.90,842 ක් පෙර වර්ෂ ගැලපුම් යටතේ දැක්වීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ අදාල වියදම් ගිණුම්වලට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | මේ වන විට ඇය ගෙවීමට තිබුණු රු.90,942 ක මුදල ගෙවීමට කටයුතු කර ඇති බව. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 571(1),(2) හා (3) | 2023 දෙසැම්බර් 31 දිනට පවතින එකතුව රු.766,766ක් වූ ඉකුත් වූ විවිධ තැන්පතු, එකතුව රු.199,621 ක් වූ පුස්තකාල තැන්පත් සහ එකතුව රු.189,856 ක් වූ ගෙවිය යුතු ගිණුම් යටතේ දැක්වෙන වර්ෂ 02ත් වර්ෂ 04 ත් අතර පැරණි ශේෂ 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | NVQ පාඨමාලා සම්පූර්ණ කිරීමට අවුරුදු 02 ක් වැනි කාලයක් ගත වන නිසා හා සිසුන්ගේ TVEC හා VIVA ඉදිරිපත් කිරීමද අවසන් කොට සහතික පත්‍ර ලබාදෙන තෙක් මුදල් රඳවා ගන්නා බැවින් පුස්තකාල තැන්පතු රාජ්‍ය ආදායමට බැර කර නොමැති බව. | පාඨමාලා අවසන්වී ඇති තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 760 | විද්‍යායතනයේ 2022වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල ඇතුළත් ආසන්න වශයෙන් අයිතම 43 ක නැති වීම් /ඌනතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iii) මුදල් රෙගුලාසි 751 | විද්‍යායතනය විසින් මිලදී ගෙන ඇති රු.267,840ක් වටිනාකමැති අයිතමයන් 26ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට එකඟ වන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7.1, 7.2, 8.1 හා 11.7 ඡේද | විද්‍යායතනයෙහි 2016 අප්‍රේල් 19 දින සිට කථිකාචාර්යවරියක් ලෙස පත්වීම් ලබා සිටි නිලධාරිනියක් විධිමත් පරිදි නිවාඩු අනුමත කිරීමකින් තොරව 2020 නොවැම්බර් 02 දින සිට විදේශගතවී තිබුණි. එම නිලධාරිනිය විදේශගතවන විට සේවය ස්ථිර කර නොතිබුණු බැවින් ඇයගේ සේවය අවසන් කිරීමට කටයුතු නොකර විද්‍යායතනයේ අධ්‍යක්ෂක විසින් ඇය නැවත සේවයට වාර්තා කරන ලද දිනය වන 2023 ජූලි 19 දක්වා පරිවාස කාලය | ඉදිරියේදී මෙවැනි අවස්ථාවන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 8.1 ඡේදය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

දීර්ඝ කරමින් සිට එදින සිට ඇයට සේවයෙන් ඉල්ලා අස්වීමට ඉඩ සලසා දී තිබුණි

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.23,653,706 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.29,703,687 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,049,981 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට හුවමාරු නොවන ගනුදෙනු වලින් ලද ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට විද්‍යායතනය පිහිටුවා වසර 09 කට වැඩි කාලයක් ගත වී තිබුණද භාවිත කරනු ලබන හෙක්ටයාර් 5.41 ක භූමි ප්‍රමාණය තුළ සමාලෝචිත වර්ෂය අවසාන වන විට විද්‍යායතනයේ වියදමින් රු.150,033,529 ක් වටිනාකමැති ගොඩනැගිලි හා යටිතල පහසුකම් ඉදිකිරීම් සිදුකර ඇතත්, එම භූමිය විද්‍යායතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම අදාල වගකිව යුතු නිලධාරීන් විසින් භූමිය සඳහා භුක්ති විදීමේ සහතිකයක් ද ලබාගැනීමට කටයුතුකර නොතිබුණි. | තවදුරටත් මේ පිලිබඳ අදාළ ඉහල නිලධාරීන් වෙත ලිපි යොමු කර ඇති බවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත විමසීම් කලද භුක්ති විදීමේ සහතික නිකුත් කිරීමේ ක්‍රියාපිලිවෙතක් නොමැති බව. | විද්‍යායතනය වෙත ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේ පාඨමාලාවන් සඳහා සිසුන් බඳවා ගැනීම් ඊට පෙර වර්ෂයේ බඳවා ගැනීම් සමග සැසඳීමේදී පාඨමාලාවන් 04ක් සඳහා ශිෂ්‍ය ලියාපදිංචියෙහි පෙර වසරට සාපේක්ෂව සියයට 10ත් සියයට 26ත් අතර සිසුන්ගේ අඩුවීමක් පැවතුණි. 2015අධ්‍යයන වර්ෂයේ සිට 2022අධ්‍යයන වර්ෂය දක්වා ලියාපදිංචි සිසුන් අතරින් විද්‍යායතනය හැර ගිය සිසුන් සංඛ්‍යාව සියයට 08ත් සියයට 25ත් අතර විය. එසේම අධ්‍යයන කටයුතු ආරම්භක වර්ෂයේ සිටම ලියාපදිංචි සිසුන්ගෙන් හැරයාම් අඩු කළ පසු ඉතිරි වන සිසුන්ගෙන් සමාලෝචිත වර්ෂය දක්වාම සාර්ථකව අධ්‍යයන පාඨමාලා නිම නොකරන ලද සිසුන්ගේ ප්‍රතිශතය සියයට 43 ත් සියයට 74ත් අතර විය. | කොරෝනා වසංගතය හා මෑත කාලීනව බලපා තිබුණු ආර්ථික අර්බුදය හේතුවෙන් පාඨමාලාවන්වලට අදාළ සිවිල් කර්මාන්ත ක්ෂේත්‍රයේ පරිහානිය හා වෘත්තීය ක්ෂේත්‍රයේ නිරතවන කර්මාන්ත ආයතන වැසී යාම නිසා සිසුන්ගේ ඉල්ලුම් යම් ප්‍රමාණයක අඩුවීමක් පවතින අතර ඇතැම් සිසුන් පාඨමාලාව සම්පූර්ණ නොකර NVQ 05 අදියර අවසානයේ විවිධ රැකියා අවස්ථා සඳහා විදෙස්ගත වී ඇති බව | ශිෂ්‍ය බඳවාගැනීම් ඉහළ නංවා ගනිමින් සහ බඳවා ගත් සිසුන් පාඨමාලා කාලය අවසන් වන තෙක් රඳවා ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් අනුගමනය කල යුතුය. |